# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2118/10 - 2019 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2019.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**වන සංරක්ෂණ ආඥාපනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරණ පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරණ (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමඟ කියවිය යුතු 3අ. වගන්තිය යටතේ වූ නියමය.

**නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරණ පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරණ (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමඟ කියවිය යුතු 3අ. වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත අංක 01 සහ 02 උපලේඛනවල මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 2926.72ක විශාලත්වයෙන් යුතු අග්‍රාබෝපත් වනාන්තරය වර්ෂ 2019 ක් වූ මාර්තු මස 18 වැනි දින සිට අග්‍රාබෝපත් සංරක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මාර්තු මස 18 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය 01**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි PP නු 2492 හි කැබලි අංක 01, 02, 03, 04, 05 සහ 06 ලෙස හඳුන්වන බෝපත්තලාව කැලේ නැමති ඉඩමේ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1960.33 ක් විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ.


1A - PG 004467 - 75 (2019/04)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උතුරට* : බෝපත්තලාව ඔය, බෝපත්තලාව රජයේ සත්ව ගොවිපල, ඇල, PPනු 158 හි කැබලි අංක 04, 06, 05, 07, 08, 01, ඇල, ඩයගම ෆාම්, බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපල, පාර, බෝපත්තලාව ඔය, TP 92925 (පෝට්මෝර් වත්ත), TP 92926 (ආර්ඩර්ලි වත්ත), ඇල, PP නු 2492 හි TP 92932 (ඩයගම බටහිර වත්ත), TP 112363 (සන්ඩ්‍රින්හැම් වත්ත), PP A 2584 හි කැබලි අංක 1, PP නු 2492 හි TP 112363 (සන්ඩ්‍රින්හැම් වත්ත), පාර, TP 112364 (පොයිස්ලන්ඩ් වත්ත), පාර, PP A 1414 හි කැබලි අංක 1, 2;

*නැගෙනහිරට* : TP 112364 (පොයිස්ලන්ඩ් වත්ත), TP 112365 (යරවල වත්ත), TP 112379 (ඩයගම නැගෙනහිර වත්ත), පාර, අග්‍රා ඔය, ඔයපළාත කෝරලේ, කිරිගල්පොත්ත ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යය;

*දකුණට* : කිරිගල්පොත්ත ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යය, කිරිගල්පොත්තකැලේ, මෙනිකැල්ලකැලේ සහ කිරිගල්පොත්ත කැලේ, බෝපත්තලාව කැලේ සහ මෙනිකැල්ලකැලේ;

*බටහිරට* : බෝපත්තලාවකැලේ සහ මෙනිකැල්ලකැලේ, කිරිමැටියාගලකැලේ සහ අලහපලහේනකැලේ, බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපල, බෝපත්තලාව ඔය.

ප්‍රමාණය : හෙක්ටයාර් 1960.33

## උපලේඛනය 02

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි අග්‍රාබෝපත් වනාන්තරයට අයත් බෝපත්තලාව කැලේ නැමති pp නු 2458 හි කැබලි අංක 01 ලෙස හඳුන්වන බෝපත්තලාව කැලේ නැමති ඉඩමේ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 966.3900 ක් විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : PP නු 2458 හි TP 84062 (ස්ටේයර් වත්ත), TP 323661 (ස්ටේයර් වත්ත), PP නු 138 හි කැබලි අංක 24, PP නු 2458 හි TP 323661 (ස්ටේයර් වත්ත), TP 84062 (ටොරිංටන් වත්ත), TP 90782 (ඇල්ඩෝරි වත්ත),TP 93564 (තොර්න්ලි වත්ත), TP 93577 (හෝම්වුඩ් වත්ත);

*නැගෙනහිරට* : PP නු 2458 හි TP 93577 (හෝම්වුඩ් වත්ත) PP නු 1101 හි කැබලි අංක 29, 5, 30 සහ 44, PP නු 1976 හි කැබලි අංක 1 සහ 2, PP නු 1101 හි කැබලි අංක 45 සහ බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපල;

*දකුණට* : බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපල, කිරිමැටියාගල කැලේ;

*බටහිරට* : කිරිමැටියාගල කැලේ, PP නු 2458 හි TP 110381 (හෙල්බෙක් වත්ත),TP 84409 (අග්‍රා ඇල්බැද්ද වත්ත), TP 84062 (ස්ටෙයර් වත්ත).

ප්‍රමාණය : හෙක්ටයාර් 966.39

04 - 729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.